www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ඝාතනයට ලක් වූ සසප ආධාරකරුවාගේ සොහොයුරා ලෝක සමාජවාදී වෙබ් අඩවිය සමග කතා කරයි

**Brother of murdered SEP supporter in Sri Lanka speaks to WSWS**

**අප වාර්තාකරුවන් විසිනි**
**2006 සැප්තැම්බර් 7**

ශ්‍රී ලංකාවේ සමාජවාදී සමානතා පක්ෂයේ (සසප) ආධාරකරුවෙකු වූ සිවප්‍රකාශම් මරියදාස් මුල්ලිපොතනෙහි පිහිටි සිය නිවසේ දී අගෝස්තු 7 වන දා රාත්‍රියේ තුවක්කුකරුවෙකු විසින් ඝාතනය කරන ලදි. මුල්ලිපොතන ත්‍රිකුනාමල වරාය නගරයේ සිට කිලෝමීටර 20ක් පමන දුරින් ඇති ගම්බද නගරයකි. පූර්න පරීක්ෂනයක් පවත්වා ඝාතකයන්ට නඩු පවරන ලෙස ඉල්ලමින් සසපය ජාත්‍යන්තර උද්ඝෝෂනයක් දියත් කර තිබේ.

මේ වන තෙක් ඝාතනය පිලිබඳව කිසිදු බැරෑරුම් පොලිස් පරීක්ෂනයක් සිදු වී නැත. සසපය විසින් මෙතෙක් එක්රැස් කරන ලද තොරතුරුවලින් පෙනී යන්නේ ඝාතකයන් ආරක්ෂක හමුදාවල, පොලීසියේ හෝ ඔවුන් හා සන්ධානගතව සිටින පැරාමිලිටරි කන්ඩායම්වල සාමාජිකයන් වන බව යි. ආන්ඩුව හා මිලිටරිය දෙමල ඊලම් විමුක්ති කොටි (එල්ටීටීඊ) සංවිධානයට ප්‍රහාර එල්ල කරමින් රට යලිත් සිවිල් යුද්ධයෙහි ගිල්වද්දී උතුරු හා නැගෙනහිර ප්‍රදේශවල ජනතාව ක්‍රමානුකූලව භීතියට පත් කෙරෙන ආකාරය මෙම ඝාතනයෙන් ඉස්මත්තට එයි.

මරියදාස්ගේ වැඩිමල් සොහොයුරා වන 34 වියැති සිවප්‍රකාශම් බෙනඩික්ට් මේ ඛේදවාචකය පිලිබඳව *ලෝක සමාජවාදී වෙබ් අඩවිය* සමග කතා කලේ ය. බෙනඩික්ට්ට තම සොහොයුරා ඝාතනයට ලක් වූ පුවත දැන ගන්නට ලැබුනේ එදා රැයේ දී ම ය. තමන් තව මත් කම්පනයෙන් පසු වන බව ඔහු කී ය. තම සොහොයුරා ඝාතනයට ලක් කලවුන් නීතිය හමුවට පැමිනවීමට සසපය ගෙන යන ජාත්‍යන්තර උද්ඝෝෂනයට ඔහු සිය සහාය පල කලේ ය.

"මගේ මල්ලිගෙ ගෙදර කිට්ටුව ඉන්න මුස්ලිම් අසල්වැසියන්ගෙන් කෙනෙක් දුරකථනයෙන් අපිට දැනුම් දුන්නා. ඒත් මේ පැත්තෙ තියෙන ආරක්ෂක තත්ත්වය නිසා රාත්‍රියෙ යන්න බැරි හින්දා අපට මුල්ලිපොතනට යා ගන්න පුලුවන් වුනේ පස්සෙන් දා උදේ."

බෙනඩික්ට් ජීවත් වන්නේ ත්‍රිකුනාමලය ආසන්නයේ පිහිටි සෙල්වනායගපුරම්හි ය. ත්‍රිකුනාමලයට දකුනින් පිහිටි මුතූර් නගරය අල්ලා ගැනීම සඳහා හමුදාව හා එල්ටීටීඊය අතර දරුනු සටන් පැවතුනු හෙයින් දිස්ත්‍රික්කය පුරා ආරක්ෂක හමුදා රැඳී සිටි අතර මාර්ග බාධක අටවා තිබුනි.

"මගේ මල්ලිගෙ ගෙදර තිබුනෙ මුතූර්වලින් ආපු සරනාගතයො සිය ගනනක් නතර වෙලා හිටපු මුස්ලිම් ඉස්කෝලයක් පිටිපස්සෙ. කිලෝමීටර් භාගයක් විතර දුරින් විශාල හමුදා කඳවුරක් තියෙනව. මේ විදියෙ ඝාතනයක් කරන්න පුලුවන් හොඳින් පුහුනු වුනු අත්දැකීම් ඇති කෙනෙකුට විතර යි. වෙන කාට හරි මේ අපරාධය කරල අහු වෙන්නෙ නැතුව පැනල යන්න ලේසි වෙන්නෙ නැහැ," බෙනඩික්ට් පැවසී ය.

අගෝස්තු 9 වන දා සෙල්වනායගපුරම් ආසන්නයේ පැවති මරියදාස්ගේ අවමඟුලට 500කට වැඩි පිරිසක් පැමිනියහ. සොල්දාදුවන් පැමින එල්ටීටීඊ සාමාජිකයෙකුගේ අවමඟුලට සහභාගි නොවිය යුතු යැයි මරනය නිසා දුකට පත් සිංහල හා මුස්ලිම් ජනයාට කියා ඇති බව ඔවුන්ගෙන් තම පවුලේ සාමාජිකයන්ට දැන ගන්නට ලැබී තිබිනැයි බෙනඩික්ට් පැවසී ය. සිය සොහොයුරාට එල්ටීටීඊය සමග කවර හෝ සම්බන්ධයක් තිබුනේ ය යන අදහස බෙනඩික්ට් ප්‍රතික්ෂේප කලේ ය.

"මගේ මල්ලිගෙ මරනෙන් දින කීපයකට පස්සෙ සෙල්වනායගපුරම්වල සොල්දාදුවො දෙන්නෙක් සවස 6ට විතර මගේ ගෙදරට ඇවිත් රෑ 7ට එයාලගෙ කඳවුරට එන්න කියල ඉල්ලා හිටිය. මම ඒ ගැන පැමිනිලි කරන්න මෙහෙ පොලීසියට ගියා. පොලීසිය මට උපදෙස් දුන්න යන්න එපැයි කියල. පස්සෙන් දා උදේ මම දන්න දෙමල පොලිස් නිලධාරියෙකුත් එක්ක කඳවුරට ගියා. පොලීසියට දැනුම් දීපු එක ගැන සොල්දාදුවන්ට කේන්ති ගිහින් අපි දෙන්න එලව ගත්තා. මට මගේ ජීවිතය ගැන බය හිතුනා."

මුල්ලිපොතනෙහි සොල්දාදුවෝ මරියදාස් පිලිබඳ අවලාද ද පැතිරවූහ. මරියදාස්ගේ ව්‍යාපාරික කටයුතු සම්බන්ධයෙන් යම් එකලාසයක් සිදු කරනු පිනිස පවුලේ සාමාජිකයන් එහි ගිය විට ඔහු ඉතා හොඳ පුද්ගලයෙකු බව කියමින් ප්‍රදේශයේ මුස්ලිම් හා සිංහල ජනයා සිය සොව පල කලහ. කෙසේ වුව ද ඒ සමග ම මරියදාස්ගේ අවමගුලේ දී එල්ටීටීඊය ඔහුට පදක්කමක් ප්‍රදානය කලේ දැයි කීප දෙනෙක් අසා සිටියහ. මිලිටරිය නගරය තුල ඒ කතාව පතුරුවා හැර තිබින.

"ඒක උද්ඝෝෂන ව්‍යාපාරයක්" යැයි බෙනඩික්ට් පැවසී ය. "දෙමල ජාතිකයෙක් ඝාතනයට ලක් වෙච්ච ඕන ම අවස්ථාවක එයා එල්ටීටීඊ සාමාජිකයෙක් ය කියල හංවඩු ගහනවා. අපි තිරිකුනාමලේ ජීවත් වෙන්නෙ බයෙන්. එක මොහොතකින් තව මොහොතකට යන කොට මොකක් සිද්ධ වේවි දැයි මහජනයා දන්නෙ නැහැ. ඕන ම මොහොතක, තිරිකුනාමලේ ඕන ම දෙයක් වෙන්න පුලුවන්.

"මරියදාස් මුල්ලිපොතනට යන්න තීරනය කලා ම අපි ඒ අදහසට විරුද්ධ වුනා. සිංහල, මුස්ලිම් හා දෙමල ජනයා අතරෙ සම්බන්ධය බොහොම ආතති සහගත තත්ත්වයකට පත් වෙල තිබුනු නිසයි අපි ඒ ගැන සැලකිලිමත් වුනේ. ඒත් තමන්ට කවුරු වත් හිරිහැර කරන එකක් නෑ කියල මරියදාස් අපිට කිව්ව.

"මගේ මල්ලි හොඳට සිංහල කතා කලා. එයා හැම විට ම අනෙක් අයත් එක්ක දුක සැප බෙදාහදා ගත්තා. සිංහල අයගෙ ජනාවාසවල (ඡායාරූප ගැනීමේ) වැඩක් ගැන කවදක හරි මොන විදියෙ හරි දෙගිඩියාවක් තිබුන නම් එයා එතෙන්ට ගිහිල්ල කිසි කරදරයක් නැතුව ආපහු එනව.

"එයා ඒ තරම් ම විවෘත, බය නැතුව ඉස්සරහට යන කෙනෙක්. මිලිටේරියත් එක්ක මොකක් හරි ප්‍රශ්නයක් තිබුන නම් එයා සොල්දාදුවන්ගෙ මූනට ම ඒ ගොල්ලො විවේචනය කරනව. එල්ටීටීඊයෙ කට්ටිය විවේචනය කරද්දිත් එයා ඒ වගේ ම යි."

බෙනඩික්ට් හා මරියදාස් යන දෙදෙනා ම අධ්‍යාපනය ලද්දේ ත්‍රිකුනාමලයේ සාන්ත ජෝශප් විද්‍යාලයෙහි ය. මරියදාස් දක්ෂ සිසුවෙකු වූ අතර ගනිත අංශයෙන් උසස් පෙල දක්වා හැදෑරූ මුත් විශ්වවිද්‍යාලයට ඇතුලු වීමට නොහැකි විය. පාසල් දිවිය හමාර කිරීමෙන් පසු සොහොයුරෝ දෙදෙන ඡායාරූප ශාලා දෙකක් ආරම්භ කලහ. බෙනඩික්ට් ත්‍රිකුනාමලයෙහිත් ඔහුගේ සොහොයුරා මුල්ලිපොතනෙහිත් ඒවා පිහිටුවා ගත්හ.

දිස්ත්‍රික්කය තුල යුද්ධය යලි ආරම්භ වීම නිසා දැවැන්ත දුෂ්කරතාවන් ඇති වී තිබෙන අයුරු බෙනඩික්ට් පැහැදිලි කලේ ය.

"යුද්දෙ නිසා අපට නිදහස නෑ. ව්‍යාපාරයක් කර ගන්න හරි අපේ මූලික අවශ්‍යතාවන් ලබා ගන්න හරි අපට කොහාට වත් යන්න විදියක් නැහැ. මේක විශාල ප්‍රශ්නයක්. ඒ හින්ද මම දිස්ත්‍රික්කයෙන් පිට වෙල යි ඉන්නෙ. සාමාන්‍ය දෙමල ජනයා හැමෝ ම මේ තත්ත්වයට මූන දෙනව.

"අපි ජීවත් වෙන සෙල්වනායගපුරම්වලට තිරිකුනාමලේ ටවුමෙ ඉඳන් කිලෝමීටර් තුනක් විතර තියෙන්නෙ. පවුල් 1,000ක් විතර එහේ ජීවත් වෙනව. ඔවුන්ගෙන් බොහොම දෙනා දෛනික කම්කරුවන් ලෙස වැඩ කරනව. මූද කිට්ටුව ඉන්න අය මාලු අල්ලන්න යනව. ධීවරයන්ට විශාල ගැටලු තියෙනව. යුද්ධය පටන් ගත්ත ම මසුන් ඇල්ලීම තහනම් කරන හින්දත් නාවික ගැටුම් හින්දත් ඔවුන්ට මූදු යන්න බැහැ. ඉතින් ඒ ගොල්ලන්ට ජීවිකාවක් උපයා ගන්න බැරිව වෙන වැඩ සොයා ගන්න වෙනව.

"ජනතාවගෙ ගමන්බිමන් සීමා වෙලා තියෙන්නෙ. පිට යන අය හවස 4-5 වෙන කොට ආපහු ගෙවල්වලට එනව. කඩසාප්පුත් කල් තියා වහනව. වීදිවල තරුනයො දකින්න ලැබෙන්නෙ නෑ. පාසල් ඇරල තියෙනව නම් ලමයින්ගෙන් භාගයක් වත් පන්තිවලට සහභාගි වෙන්නෙ නැහැ. ජීවිතේ දුෂ්කර යි.

"මොකද්ද කියල මට හරියට ම කියන්න බැරි වුනත්, අපි මූන දෙන ගැටලුවලට විසඳුමක් තියෙන්න ඕන. යුද්ධය අවසන් වීමත් හැම දෙනාට ම සාමය ලඟා වීමත් අපිට අවශ්‍ය යි."

පූර්න පරීක්ෂනයක් පවත්වා මෙම ඝාතනය සම්බන්ධයෙන් වගකිව යුතු සියලු දෙනා අත් අඩංගුවට ගෙන චෝදනා ඉදිරිපත් කරන ලෙස ඉල්ලමින් මරියදාස් ඝාතනය පිලිබඳව විරෝධය පල කරන ලිපි ශ්‍රී ලාංකික අධිකාරීන් වෙත යවන මෙන් සමාජවාදී සමානතා පක්ෂය ද *ලෝක සමාජවාදී වෙබ් අඩවිය* ද සිය සියලු පාඨකයන්ගෙන් හා ආධාරකරුවන්ගෙන් උදක් ම ඉල්ලා සිටී.

විරෝධතා ලිපි යැවිය යුත්තේ මේ ලිපිනයන්ට යිඃ

පොලිස්පති චන්ද්‍රා ප්‍රනාන්දු,
පොලිස් මූලස්ථානය, කොලඹ 01, ශ්‍රී ලංකාව.
ෆැක්ස් අංකයඃ 0094 11 2446174
විද්‍යුත් තැපැලඃ igp@police.lk

නීතිපති කේ.සී. කමලාසබේසන්,
නීතිපති දෙපාර්තමේන්තුව,
කොලඹ 12, ශ්‍රී ලංකාව.
ෆැක්ස් අංකයඃ 0094 11 2436421

ශ්‍රී ලංකාවේ සමාජවාදී සමානතා පක්ෂය හා *ලෝක සමාජවාදී වෙබ් අඩවිය* වෙත ද එම විරෝධතා ලිපිවල පිටපත් එවිය යුතු ය.

සමාජවාදී සමානතා පක්ෂය
තැ.පෙ. 1270,
කොලඹ, ශ්‍රී ලංකාව.

*ලෝක සමාජවාදී වෙබ් අඩවියේ* කර්තෘ මන්ඩලය වෙත ලිපි යැවීම පිනිස මෙය භාවිත කරන්නඃ online form

© www.wsws.org